DOI : 10.31357/fhssmst.2012.00693

# "සුනාමි ව්‍යසනයෙන් පසු ජනතාව යළි පදිංචි කිරීමේ කටයුතු වලදී ඇතිවන සමාජ ගැටළු (දෙවුන්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ඇසුරින්)"

ලක්මි ඉමාෂා ගොඩකන්ද
සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
නුගේගොඩ.

ශාස්ත්‍රපති 2012

## කර්තෘගේ ප්‍රකාශය

මේ ශාස්ත්‍රීය නිබන්ධනය සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණයේ අවශ්‍යතා සපුරාලීම සඳහා මහාචාර්ය මයුර සමරකෝන් මහතාගේ මාර්ගෝපදේශකත්වය හා සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද බවත්, මේ පර්යේෂණය කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්ව විද්‍යාලයකට හෝ ආයතනයකට හෝ වෙනත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් සඳහා ද ඉදිරිපත් නොකරන ලද බවත් සහතික කරමි.

.................................
අත්සන

2012 /04 /02
.................................
දිනය

නම - ලක්මි ඉමාෂා ගොඩකන්ද

අංකය - GS/MA/SOC/2646/06

## උපදේශකවරයාගේ ප්‍රකාශය

සමාජ විද්‍යා ශාස්ත්‍රපති උපාධි පර්යේෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා අංක GS/MA/SOC/2646/06 දරණ අපේක්ෂිකාව විසින් ඉදිරිපත් කරනු ලබන මෙම පර්යේෂණ නිබන්ධනය මාගේ අධීක්ෂණය සහ මඟ පෙන්වීම යටතේ සම්පාදනය කරනු ලැබුවකි. මෙම පර්යේෂණ කෘතිය ශාස්ත්‍රපති උපාධි පර්යේෂණ ඇගයීම් කටයුතු සඳහා ඉදිරිපත් කිරීමට සුදුසු මට්ටමක පවතින බව මෙයින් සහතික කරමි.

උපදේශකවරයාගේ නම - මහාචාර්ය මයුර සමරකෝන් මයා

අත්සන -

දිනය - 2012/04/02

පරීක්ෂක මණ්ඩලය විසින් නිර්දේශිත සියලු නිවැරදි කිරීම්, සංශෝධන සහ එකතු කිරීම් උපාධි අපේක්ෂිකාව විසින් අවසාන නිබන්ධනය සඳහා ඇතුළත් කර ඇති බව මෙයින් සහතික කරමි.

උපදේශකවරයාගේ අත්සන - ..............................

දිනය - 2012/04/02

## පිදුම

අනන්ත වූ ගැහැට විඳ

මා හැදූ දෙමාපියන්ටත්

සෙවනැල්ල මෙන් නිති රැඳුණු

සහෝදරයාටත්

ජීවිතයේ ඉදිරිගමනට

නිබඳ මඟ පෙන්වූ

ගුරුවරුන්ටත්

මෙම කෘතිය පුද කරමි.

සුනාමි ව්‍යසනයෙන් පසු ජනතාව යළි පදිංචි කිරීමේ කටයුතු වලදී ඇතිවන සමාජ ගැටළු පිළිබඳ දෙවුන්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ඇසුරින් සිදු කරනු ලබන අධ්‍යයනය.

ලක්මි ඉමාෂා ගොඩකන්ද

## සංක්ෂිප්තය.

සමාජය යනු සංකීර්ණ සම්බන්ධතා ජාලයකින් සමන්විත වූවකි. මෙම සම්බන්ධතා ජාලය ඔස්සේ පුද්ගලයින් වෙනස් වෙමින් ඉදිරියට ගමන් කරයි. සාමාන්‍යයෙන් පුද්ගලයාට සම්බන්ධතා වලින් වියුක්තව ජීවත්විය නොහැක. සමාජය මෙන්ම පුද්ගලයා ද නිරන්තර වෙනස්වීමට ලක්වේ. හෙරක්ලීටස් නම් දාර්ශනිකයා පවසන පරිදි පුද්ගලයාට එකම ගහට දෙවරක් නොබසී. එයින් අදහස් කරනු ලැබුවේ ගහ සහ පුද්ගලයා යන පාර්ශවයන් දෙකම නිරන්තර වෙනස්වීමට ලක්වන බවයි. මෙවැනි සංකීර්ණ සම්බන්ධතා වලින් යුත් සමාජයක ජීවත් වන මිනිසුන් විවිධ හේතු සාධක මත ගැටළු සහගත අවස්ථාවන්ට මුහුණදේ.

මිනිසා විසින් ඇති කරනු ලබන විවිධ ගැටුම් හේතුවෙන් සහ ස්වභාවිකව සිදුවන හානි හේතුවෙන් පුද්ගලයින් අවතැන්වීමට ලක්වේ. සෑම රටකටම පොදු තත්ත්වයක් වන මෙය මගින් වර්තමානය වන විට ලෝකය පුරා අවතැන්වීමට ලක්වූ ජනතාව මිලියන 43.7ක් ලෙස වාර්තාවේ. වාර්ගික හා යුධ ගැටුම් හේතුවෙන් පුද්ගලයින් අවතැන්වීමට ලක්වීමේදී එය දීර්ඝ කාලීන වශයෙන් පුද්ගලයාට බලපානු ලබන අතර සුළිසුළං, ගංවතුර,නායයෑම්,සුනාමි වැනි ස්වභාවික ව්‍යසන හේතුවෙන් පුද්ගලයින් අවතැන්වීමට ලක්වුවද පෙර තත්ත්වය මෙන් දීර්ඝකාලීන නොවේ.

මෙවැනි ස්වභාවික ව්‍යසන හේතුවෙන් අවතැන් වන පුද්ගලයින් නැවත නගා සිටුවීම සඳහා විවිධ ආයතන සහ පුද්ගලයින් ක්‍රියාකරනු ලබයි. ව්‍යසනයක ආසන්නතම අවස්ථාවේදී ජනතාවගේ මුලික අවශ්‍යතා සපුරාලීම වෙනුවෙන් විවිධ වැඩපිළිවෙල සකස් කර

ක්‍රියාත්මක කරන අතර දීර්ඝ කාලීන පියවර යටතේ පුද්ගලයින් යලි පදිංචි කිරීම සඳහා,ඔවුන්ගේ ජීවනෝපාය නගා සිටුවීම වෙනුවෙන් ද කටයුතු කෙරේ.

මෙසේ කිසියම් ව්‍යසනයකින් පසු ජනතාව නැවත පදිංචි කිරීමේදී නොයෙකුත් ගැටළු වලට මුහුණදීම සුලභ කාරණයකි. නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය කිසිදා නතර නොවන දෙයක් වන හෙයින් එහිදි මුහුණදීමට සිදුවන ගැටළු තාවකාලික වේයැයි සිතීම දුෂ්කරය. විවිධ ප්‍රදේශ වල ජීවත්වූ විවිධ සංස්කෘතීන්ට අයත් ජනතාවක් එකම භූමිභාගයක පදිංචි කිරීම තුළ විවිධාකාර ගැටළු මතුවිය හැක. ඒ වෙනුවෙන් අවධානය යොමුකර ගැටළු අවම වනසේ ක්‍රියාකිරීම ගතහැකි වඩාත් සුදුසුම පියවර වන්නේය. මෙම පර්යේෂණය මගින් සුනාමි ව්‍යසනය හේතුවෙන් අවතැන්වීමට ලක්වූ ජනතාව යලි පදිංචි කිරීමේදී මුහුණදීමට සිදුවන සමාජ ගැටළු පිලිබඳව අවධානය යොමු කරනු ලබන අතර ඉදිරියේදී එවන් නැවත පදිංචි කිරීම්හිදී මතුවන ගැටළු සහගත අවස්ථාවන් මඟ හරවා ක්‍රියාකිරීමට මෙය වඩාත් වැදගත්වේ.

ඒ අනුව මෙම පර්යේෂණය මගින් මාතර දිස්ත්‍රික්කය තුළ සුනාමි ව්‍යසනයට ලක්වූ දෙවිනුවර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය පදනම් කර ගනිමින් පුද්ගලයින් නැවත පදිංචි කිරීමේදී සමාජ සම්බන්ධතා ගොඩනගා ගැනිම,එහිදී මතුවන සමාජ ගැටළු, ආපදා කළමනාකරණය සහ නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය පිලිබඳව ප්‍රධාන වශයෙන් අවධානය යොමුකරන්නට යෙදුණි. සමස්තයක් වශයෙන් ගත්විට නැවත පදිංචි කිරීම තුළ මතුවන ගැටළු අවම කර ගැනීම වෙනුවෙන් ගතහැකි පියවර හඳුනා ගැනීම මෙහි අරමුණ වේ.

සමාජය, සමාජ සම්බන්ධතා නිරන්තර වෙනස් වීමට ලක්වීම තුළ සමාජ ගැටළු ඉස්මතුවේ. පුද්ගලයින් එක් එක් කාලවකවානු වලදී නොසිතූ පරිදි මුහුණදෙනු ලබන විවිධ සිද්ධිදාමයන් හේතුවෙන් ඇතිවන්නාවූ ගැටළු වලට විසඳුම් සෙවීමත් ඒවා අවම කර ගැනීමට ක්‍රියාකිරීමත් නිරන්තරව සිදුවන්නක් සහ නිරන්තර අවධානයට ලක්කළ යුතු කරුණකි.

# පටුන


**01. සුනාමි ව්‍යසනය මගින් සිදුවූ බලපෑම හඳුනා ගැනීම.**

01.01 හැඳින්වීම 1 - 10

01.02 අධ්‍යනයේ අරමුණු 11

01.03 අධ්‍යයන ක්ෂේත්‍රය 12 - 13

01.04 පර්යේෂණ මුලාශ්‍රය,ක්‍රමවේදය සහ නියැදිය විස්තර කිරීම 14 - 16

01.05 පර්යේෂණයේ සීමාවන් සහ ගැටළු 17 - 19

**02. පුද්ගලයා සහ සමාජය**

02.01 සමාජය, සමාජ සම්බන්ධතා සහ සමාජ ගැටළු හඳුනා ගැනීම 20 - 35

02.01.01 ප්‍රාථමික හා ද්විතීක සමාජ සම්බන්ධතා හඳුනා ගැනීම 36

02.01.01.01 ප්‍රාථමික සමාජ සම්බන්ධතා 37 - 40

02.01.01.02 ද්විතීක සමාජ සම්බන්ධතා 41 - 44

02.02 ශ්‍රී ලංකාවේ සමාජ සම්බන්ධතා ගොඩනැගීම හඳුනා ගැනීම. 45 - 51

**03. ශ්‍රී ලංකාව තුළ සිදුවූ ආපදා සහ ආපදා කළමනාකරණය**

03.01 උපද්‍රව සහ ආපදා හඳුනා ගැනීම 52 - 59

03.02 ආපදා කළමනාකරණය හැඳින්වීම 60 - 68

03.03 ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ ඉතිහාසය සහ වර්ධනය 69 - 72

03.03.01 2005 වසරට පෙර ආපදා කළමනාකරණ ප්‍රතිපත්ති 73 - 74

03.03.02 ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ ප්‍රතිපත්ති 75 - 76

03.03.03 ආපදා කළමනාකරණ නීතිරීති 77 - 79

03.03.04 ආපදා කළමනාකරණ ආයතනික ව්‍යුහය 80 - 85

03.04 ආපදා කළමනාකරණ කාර්යයේදී මුහුණදෙන ගැටළු 86 - 87

03.04.01 ආපදා කළමනාකරණයේදී සිදුවිය හැකි අක්‍රමිකතා 88 - 90

**04. නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය සහ ආයතනික ක්‍රියාමාර්ග හඳුනා ගැනීම.**

04.01 නැවත පදිංචි කිරීම 91-105

04.01.01 ශ්‍රී ලංකාවේ නැවත පදිංචි කිරීමේ තත්ත්වයන් සහ සුනාමි නැවත පදිංචි කිරීම සඳහා ගනුලැබූ ක්‍රියාමාර්ග 106-117

04.01.02 ලෝකයේ සුනාමි නැවත පදිංචි කිරීමේ තත්ත්වයන් සහ ගෙනඇති ක්‍රියාමාර්ග 118-128

04.02 ආයතනික ක්‍රියාමාර්ග විස්තර කිරීම 129-131

04.02.01 ප්‍රදේශය තෝරා ගැනීම සහ ප්‍රතිලාභීන් තෝරා ගැනීම 132-138

**05. සුනාමි ව්‍යසනයෙන් පසු ජනතාව යළි පදිංචි කිරීමේ ගැටළු හඳුනා ගැනීම**

05.01 දත්ත විශ්ලේෂණය 139-160

**06. සමාලෝචනය,නිගමන සහ යෝජනා** 161-173

ඇමිනුම් අංක 01 174-175

ඇමිනුම් අංක 02 176

ඇමිනුම් අංක 03 177-178

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 184-194

## වගු, රූප සටහන් සහ සිතියම්

### වගු


01.01 සුනාමි හේතුවෙන් අහිමි වූ ජීවිත හා දේපළ හානි 2

01.02 දිස්ත්‍රික්ක වශයෙන් හානියට පත්වූ නිවාස 4

01.03 මාතර දිස්ත්‍රික්කය තුළ සුනාමියෙන් හානියට පත් ග්‍රාම නිලධාරී වසම් 6

01.05 ධීවර කලාප තුළ ජනගහනයෙන් ධීවර ජනගහන ප්‍රතිශතය 7

03.01 ශ්‍රී ලංකාවේ ප්‍රබලතම ආපදා වර්ග 10 55

03.02 හානියට පත් පුද්ගලයින් සංඛ්‍යාව 56

04.02 හානියට පත් නිවාස සහ ඒවා නැවත ගොඩනැගීම වෙනුවෙන් ඇස්තමේන්තු ගත මුදල 113

04.03 සුනාමි ව්‍යසනය බලපෑ රටවලට සිදුවූ හානිය 118

04.07 මාතර දිස්ත්‍රික්කය තුළ සුනාමියෙන් හානියට පත් ගොඩනැගිලි 129

04.08 මූල්‍යාදායකකරුවන් සහ නිවාස හිමියන් විසින් හානියට පත් නිවාස ඉදිකිරීමේ ඇස්තමේන්තුව 134

05.01 මාවත් අතපත්තු ගම්මානයෙහි නව පදිංචිකරුවන්ගේ මුල් ගම 141

05.02 නව පදිංචිකරුවන්ගේ වෘත්තීන් 143

05.03 නිවස සහ මුහුද අතර පිහිටි දුර ප්‍රමාණය 145

05.04 නව පදිංචිකරුවන් ගමනාගමනය සිදු කරන ආකාරය 147

05.05 දරුවන් අධ්‍යාපනය ලබන ආකාරය 149

05.06 පෙර පදිංචි ප්‍රදේශයේ ජීවත්වන ජනතාවගේ නිවස සහ මුහුද අතර ඇති දුර ප්‍රමාණය 158

රූප සටහන් සහ සිතියම්

01.04 2004 වර්ෂය වනවිට මාතර දිස්ත්‍රික් ජනගහනය 7

03.03 ආපදා කළමනාකරණ චක්‍රය 62

04.01 ශ්‍රී ලංකාව තුළ සුනාමියෙන් හානියට පත් ප්‍රදේශ 179

04.04 ඉන්දුනීසියාව තුළ සුනාමියෙන් හානියට පත් ප්‍රදේශ 180

04.05 ඉන්දියාව තුළ සුනාමියෙන් හානියට පත් ප්‍රදේශ 181

04.06 තායිලන්තය තුළ සුනාමියෙන් හානියට පත් ප්‍රදේශ 182

04.09 මාවන් අතපත්තු ගම්මානය 183

# 01. සුනාමි ව්‍යසනය මගින් සිදුවූ බලපෑම හඳුනා ගැනීම.

## 01.01 හැඳින්වීම

යම් රටක ප්‍රදේශයක ජීවත්වන ජනතාව විවිධ හේතු සාධක මත අවතැන්වීමට ලක්වේ. මිනිසා විසින්ම නිර්මාණය කර ගන්නා ලද ගැටුම්, සංවර්ධනීය සාධක මෙන්ම ස්වභාවික හේතු සාධක ද මානව ඉතිහාසයේ අනාදිමත් කාලයක සිට මිනිසා අවතැන් කිරීමේ කාරකයක් ලෙස ක්‍රියා කරයි. භූමිකම්පා, ජල ගැලීම්, නාය යෑම්,සුළි සුළං, දීර්ඝ කාලීන නියං සාගත, වසංගත රෝග වැනි භෞතික ක්‍රියාකාරීත්වයන් මේ සඳහා දායක වේ. කෙසේ වෙතත් මෙවැනි භෞතික හේතු සාධක නිසා සිදුවන අවතැන්වීම් සංසන්දනාත්මක වශයෙන් මිනිසා කෙටි කාලයකට පමණක් අවතැන්වීමට ලක් කරන බව පෙනී යන අතර මිනිසා විසින් නිර්මාණය කරන ලද ගැටුම් ඊට වඩා දීර්ඝ කාලීන අවතැන්වීම් ස්ථාපනය කරන බව පෙනී ගොස් තිබේ.

2004 දෙසැම්බර් මස 26 වන දින සිදු වූ සුනාමි ව්‍යසනය ද එවැනි ස්වභාවික හේතු සාදක මත සිදු වු අවතැන්වීම්, ජීවිත අහිමි කිරීම්, දේපළ අහිමි කිරීම් වැනි විශාල ව්‍යසනයක් සිදු කරන ලද එක් අවස්ථාවකි. සුමාත්‍රා දූපත ආශ්‍රිතව ඇති වූ භූමි කම්පාව නිසා සුනාමි රළ පැමිණි බොහෝ රටවල වෙරළ ආශ්‍රිත කළාප විනාශයට පත්විය. මෙම ස්වභාවික ව්‍යසනය මගින් සෘජු ලෙස මෙන්ම වක්‍රාකාරව ද පුද්ගලයාට මෙන්ම දේපළ වලට සිදු වූ හානිය අති විශාල වේ.

(වගු අංක 01.01)

සුනාමි හේතුවෙන් අහිමි වු ජීවිත හා දේපළ හානි -

| ජීවිත හානි | සංඛ්‍යාව |
|---|---|
| අහිමි වු ජීවිත සංඛ්‍යාව | 35,322 |
| තුවාල ලැබූ පුද්ගලයින් සංඛ්‍යාව | 21,441 |
| අභ්‍යයන්තර අවතැන්වීමට ලක්වු සංඛ්‍යාව | 516,150 |
| | |
| දේපළ හානි | |
| හානියට පත්වු නිවාස සංඛ්‍යාව | 98,000 |
| අහිමි වු ජීවනෝපාය සංඛ්‍යාව | 150,000 |

මූලාශ්‍රය: TAFAN,Central Bank,MoF – National Planning Department, Sector Report-**2005**

2005 ජනවාරි 13 වන දින වන විට යුනිසෙෆ් (UNICEF) ආයතනය ප්‍රකාශ කරන අන්දමට අවතැන්වු ජනතාව රැඳි සිටින කඳවුරු ප්‍රමාණය 364 ක් විය. වෙරළ ආශ්‍රිත ප්‍රදේශ වල ජීවත්වූ පවුල් ප්‍රතිශතයෙන් 13% ක ප්‍රමාණයක් සුනාමි ව්‍යසනය හේතුවෙන් නිවාස අහිමිවීමේ තත්ත්වයට පත් වී තිබේ. (www.adb.org/Documents/Reports/Rebuilding_Sri_Lanka)

මිනිස් ජිවිත අහිමි වීම, අවතැන්වීම, දේපළ අහිමිවීම, දරුවන්ට දෙමව්පියන් අහිමිවීම, ස්වාමියාට බිරිඳ ද බිරිඳට ස්වාමියා අහිමිවීම, නෑදෑයන් අහිමිවීම වැනි විශාල ව්‍යසනයක් සිදුවිය. මේ හේතුවෙන් දරුවන් 900 දෙනෙක් පමණ දෙමව්පියන් අහිමි වීමෙන් තනි වු අතර එයින් 3000 කට වැඩි ප්‍රමාණයක් මව හෝ පියා සමග පමණක් තනිවිය. මේ ආකාරයෙන් සෘජුව සහ වක්‍රාකාරව සිදු කරන ලද බලපෑම අති විශාලය.

(www.sarvodaya.org/wp-content/PwC-**Tsunami**-Report_final.pdf)

මෙම ව්‍යසනයට ගොදුරු වූ පුද්ගලයින් නැවත නගා සිටුවීම වෙනුවෙන් විවිධ ක්‍රියාමාර්ගයන් අනුගමනය කරන ලදි. ඔවුන්ට මූලික අවශ්‍යතා සැපයීමට රජය මෙන්ම විවිධ ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, සාමාන්‍ය ජනතාව ඉදිරිපත් විය. මේ වෙනුවෙන් කෙටිකාලීන ක්‍රියාමාර්ග මෙන්ම දීර්ඝ කාලීන විසඳුම් ද අනුගමනය කරන ලදි. මෙසේ අවතැන්වූ පුද්ගලයින් වෙනුවෙන් ඒ ආසන්න කාලය තුළ කෙටිකාලීන විසඳුම් ලෙස තාවකාලික කඳවුරු ඉදිකිරීම, ආහාරපාන ලබාදීම, සෞඛ්‍ය සහ සනීපාරක්ෂක වැනි මූලික අවශ්‍යතා සැපයීම කෙරෙහි විශේෂ අවධානය යොමු කළ අතර මානසික සෞඛ්‍ය නැවත ගොඩ නැගීම වෙනුවෙන් ද විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. මුල් කාලවකවානුව ගෙවීයාමෙන් අනතුරුව දිගුකාලීන විසඳුම් කෙරෙහි රජය මෙන්ම විවිධ ආයතන ඒ වෙනුවෙන් අවධානය යොමු කරන්නට විය. එහිදී ඔවුන් වෙනුවෙන් ස්ථිර වාසස්ථාන ඉදිකිරීමට කටයුතු කිරීම ඒ වෙනුවෙන් ගත් එක් ක්‍රියාමාර්ගයකි.

සෘජුව සහ වක්‍රව මෙම ව්‍යසනයට ගොදුරු වූ ජනතාව වෙනුවෙන් රජය ගත් ක්‍රියා මාර්ගයන්ට සමාන්තර සේවයක් රාජ්‍ය නොවන සංවිධාන මගින් ද ඉටු කරන ලදි. මේ අතර යුනිසෙෆ්UNITED NATIONS CHILDREN'S FUND(UNICEF), යූඑන්ඩීපීUNITED NATIONS DEVELOPMENT PROGRAMME(UNDP), වර්ල්ඩ් විෂන්WORLD VISION, සීසීඑෆ්CHRISTIAN CHILD FEDERATION (CCF), කෙයාර් ඉන්ටර්නැෂනල්CARE INTERNATIONAL, ලෝඩ්ස්ටාර්LOADSTAR, ජීටීඉසෙඩ්GERMAN TECHNICAL CO-OPERATION(GTZ), රතු කුරුස සංවිධානය RED CROSS, ප්ලෑන් ශ්‍රී ලංකාPLAN SRI LANKA, ළමා රැකවරණයSAVE THE CHILDREN, මර්සි ක්‍රොප්MERCY CROP ආදි රාජ්‍ය නොවන සංවිධාන විශාල වශයෙන් මෙයට මැදිහත් විය. ඔවුන් විසින් අවතැන් වූ ජනතාව වෙනුවෙන් නිවාස ඉදිකිරීම, ආර්ථික තත්ත්වය ගොඩනැංවීම, ජනතාවගේ බිඳවැටුණු මානසිකත්වය නගා සිටුවීම, දරුවන් වෙනුවෙන් ක්‍රියා කිරීම වැනි විවිධ පියවර ගන්නා ලදි.

(වගු අංක 01.02)

දිස්ත්‍රික්ක වශයෙන් හානියට පත් වූ නිවාස පිළිබඳ සැලකිල්ලට ගැනීමේදී;

| හානියට පත්වූ දිස්ත්‍රික්ක | සම්පූර්ණ හානි | අර්ධ හානි | සම්පූර්ණ සංඛ්‍යාව | ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| ගාල්ල | 4479 | 7147 | 11626 | 13.1 |
| මාතර | 1667 | 4571 | 6238 | 7.0 |
| හම්බන්තොට | 1076 | 1369 | 2445 | 2.8 |
| **දකුණු පළාත** | **7,222** | **13,087** | **20,309** | **229** |
| | | | | |
| කොළඹ | 2824 | 3521 | 6345 | 7.2 |
| ගම්පහ | 227 | 627 | 854 | 1.0 |
| කළුතර | 2056 | 3685 | 5741 | 6.5 |
| **බස්නාහිර පළාත** | **5,107** | **7,833** | **12,940** | **14.6** |
| | | | | |
| පුත්තලම | 12 | 43 | 55 | 0.1 |
| **වයඹ පළාත** | **12** | **43** | **55** | **0.1** |
| | | | | |
| අම්පාර | 8139 | 10671 | 18810 | 21.2 |
| මඩකලපුව | 7445 | 9960 | 17405 | 19.7 |
| ත්‍රිකුණාමලය | 3893 | 3638 | 7531 | 8.5 |
| **නැගෙනහිර පළාත** | **19,477** | **24,269** | **43,746** | **49:4** |
| | | | | |
| යාපනය | 3369 | 2146 | 5515 | 6:2 |
| මුලතිවු | 4428 | 1263 | 5691 | 6:4 |
| කිලිනොච්චි | 288 | 0 | 288 | 0:3 |
| **උතුරු පළාත** | **8,085** | **3,409** | **11,494** | **13:0** |
| **එකතුව** | **39,903** | **48,641** | **88,544** | **100** |

මූලාශ්‍රය: ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව,මහබැංකු වාර්තා - 2005

වගු අංක 01.02හි සඳහන් දත්ත වලට අනුව දකුණු පළාත තුළ ගාල්ල, මාතර, හම්බන්තොට යන දිස්ත්‍රික්ක සුනාමි ව්‍යසනය මගින් හානියට පත්වූ අතර එහි හානියට පත්වූ නිවාස ප්‍රතිශතය 22.9%කි. එයින් මාතර දිස්ත්‍රික්කය තුළ හානියට පත් නිවාස 6,238ක් වන අතර එය ප්‍රතිශතයක් ලෙස ගත්විට 7%කි.